රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி: (94) 011- 2694560 / Telephone
ෆැක්ස් / தொலைநகல்: (94) 011- 2692254 / Fax
ඊ-මේල් / மின்னஞ்சல்: dgcs@pubad.gov.lk / E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: www.pubad.gov.lk / Web Site

මගේ අංකය / எனது இல / My No: CS/DOS/අන්තර්ග්‍රහණය

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2023.01.03

අමාත්‍යාංශ ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

දිස්ත්‍රික් ලේකම්වරුන්

ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කරන ලද නිලධාරීන්ට දෙපාර්තමේන්තුගත තනතුරු සඳහා වන උසස් කිරීම් පටිපාටි අනුව උසස්වීම් ලබා දීම</u>**

අංක 1774/31 දරණ 2012.09.07 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් සංශෝධිත අංක 1745/11 හා 2012 පෙබරවාරි මස 14 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත්කළ සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවෙහි 14වන ඡේදය ප්‍රකාරව රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ රජයේ ප්‍රතිපත්තිය මත විවිධ තනතුරු නාම යටතේ 2011.08.01 දිනට පෙර රාජ්‍ය සේවයට බඳවා ගනු ලැබ MN4-2006(A) වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කිරීම සිදු කරනු ලබයි.

02. එලෙස සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය පළ කරන ලද නිලධාරීන්ට නැවත එම මනාපය ඉල්ලා අස්කර ගැනීමට අවස්ථාව ලබා නොදීමට යටත්ව අන්තර්ග්‍රහණය කිරීමට 2017.05.23 දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹී අංක අමප /17/0759/734/015 හා 2017.05.31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය හිමි වී ඇත.

03. එමනිසා සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කරන ලද නිලධාරීන්ට සංවර්ධන නිලධාරී සේවයේ ශ්‍රේණිගත උසස්වීම් ලබාදීමේ කටයුතු සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණ කටයුතුවලට සමගාමීව සිදු කරනු ලබන බවත් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය පළ කර නොමැති නිලධාරීන් සඳහා පමණක් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2012 හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක PSC/EST/03-05/06/2017 හා 2017.10.04 දිනැති ලිපිය අනුව උසස්වීම් පටිපාටි සකස් කර ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ හැකි බව කාරුණිකව දන්වමි.

04. ඒ අනුව ඔබ කාර්යාලයට අනුයුක්තව සේවයේ නියුතු සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කරන ලද නිලධාරීන්ට ඉහත 03 ඡේදයේ සඳහන් උසස් කිරීම් පටිපාටි අනුව උසස්වීම් ලබා දීමට කටයුතු නොකළ යුතු අතර, රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබාදීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය මත 1994 වසරේ සිට 2011.08.01 දින දක්වා විවිධ තනතුරු නාම යටතේ බඳවාගනු ලැබ MN4-2006 වැටුප් ලැබූ නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කර නොමැති බව ඔවුන්ගේ පෞද්ගලික ලිපි ගොනු සහ අනෙකුත් පොදු ගොනු ආශ්‍රයෙන් තහවුරු කර ගැනීමෙන් පසුව පමණක් දෙපාර්තමේන්තුගත තනතුරු සඳහා සකස් කරනු ලබන උසස් කිරීම් පටිපාටි අනුව උසස්වීම් ලබා දීමට ක්‍රියා කළ යුතු බව කාරුණිකව දන්වමි.

එස්. ආලෝකබණ්ඩාර
**ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්**